

# සෝකය හුලකි
# මහත් වේදනා ගෙනදෙන

බත්තරමුල්ල පන්නිපිටිය පාරේ
සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි
පාරමී දම් සංවිධානයේ සභාපතිනි

අභාවප්‍රාප්ත පිංවත්

# පියසීලි රාජකරුණා මැතිණියට

උතුම් නිවනම වේවා

**ආචාර්ය පූජනීය**

**මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ විසිනි**

**පාරමී දම් සංවිධානය**

**සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන**

**බත්තරමුල්ල**

**2009 ජූලි 01**

# <u>සල්ලසුත්තං</u>

**ශෝකය හුලක් - මහත් වේදනා ගෙන දෙන**

අනිමිත්තමනඤ්ඤාතං මච්චානං ඉධ, ජීවිතං,
කසිරඤ්ච පරිත්තඤ්ච තඤ්ච දුක්ඛෙන සඤ්ඤුතං

**මේ ලෝකයෙහි මනුෂ්‍යයන්ගේ මරණය ගැන පෙර නිමිති කිව නොහැකිය. හැබෑ සුවයක් නොව ජීවිතදුකින් වැසී ඇත. දුකින්ම ගතවෙයි**

නහි සො උපක්කමො අත්ථි යෙන ජාතා න මීයරෙ,
ජරම්පි පත්වා මරණං එවංධම්මා හි පාණිනො

**උපන් සත්වයනට මරණයෙන් බේරී සිටීමට කිසිදු උපක්‍රමයක් මෙලොව නැත. ක්‍රමයෙන් දිරාගොස් මරණයට පැමිණෙති. සත්වයන්ට මෙය උරුම දහමකි**

ඵලානමිව පක්කානං පාතො පතනතො භයං.,
එවං ජාතානමච්චානං නිච්චං මරණතො භයං

**ඉදුනු ඵල හිම්දිරියේම බිමට වැටෙයි. ඊකට එය බියකි. උපන් සත්වයාට නිරතුරුවම මරණ බිය පවතී**



යථාපි කුම්භකාරස්ස කතා මත්තිකභාජනා,
සබ්බෙ භෙදනපරියන්තා එවං මච්චාන ජීවිතං

**යම්සේ මැටි බඳුන් සදනනන් විසින් කරන මැටි බඳුන් කුමන හෝ මොහොතක බිඳීමටම ඉඩ ඇත්තේය. මිනිසුන්ගේ ජීවිතද එබඳුමය**

දහරා ච මහන්තා ච යෙ බාලා යෙ ච පණ්ඩිතා,
සබ්බෙ ම ච්චුවසං යන්ති සබ්බෙ මච්චුපරායනා

**වැඩිහිටි ළදබොළඳ උගත් නුගත් සියළු දෙනාම මරණයට පත්වෙති. මරණයම උරුම කොට වෙසෙති**

තෙසං ම ච්චුපරෙතානං ගච්ඡතං පරලොකතො,
න පිතා තායතෙ පුත්තං ඤාතී වා පන ඤාතකෙ

**යමෙක් මරණයට යටත්ව පරලොව යන විට පියාණන්ට වුවද පුතණුවන් රැකිය නොහැක්කේය. ඥාතීන්ට වුවද පරලොව ගමනේදී ඥාතීන් රැකිය නොහැක්කේය**

පෙකඛතං  යෙව ඤාතීනං ප සස ලාලපතං පුථු.
එකමෙකො ච මචචානං ගොවජෙඣා විය නියති

ගව ඝාතකයෙක් එක් එක් ගවයා මරණයට
ගෙන යන්නාසේම, ඥාතීන් හඬා දොඩද්දීම
මරහු විසින් ඒ ඒ අය මරණයට
රැගෙන යන සැටි බලන්න

එවමබභාහතො ලොකො මචචුනා ච ජරාය ච,
තසමා ධීරා න සොචනති විදිතවා ලොකපරියායං

මේ අයුරින් ලොව සත්වයෝ මරණයෙන් ජරාවෙන් ද
නිරතුරුවම වැළුනේ වෙයි. නුවණැති මනුෂයයෝ
මේ බව දැන සෝක නොකරති

යසස මගගං න ජානාසි ආගතසස ගත සසවා,
උභො අනෙත අසමපසසං නිරතථං පරිදෙවසි

යමෙක් මව් කුසට පැමිණි අයුරුද මරණින් පසු
යන තැනද ලෙසින් මේ අවස්ථා දෙකම ගැන
නොදන්නා තැනැත්තේ මෙලොව වැළපෙන්නේ
තේරුමක් නැතිවමය



පරිදෙවයමානො චෙ කඤචි අතථං උදබබහෙ,
සමමූළෙහා හිංසමතතානං කයිරා චෙනං
විචකඛණො

වෙනස්වීමක් නිසා හඬමින් වැළපෙමින් සිටින
කෙනෙකුට එමඟින් සෙතක් වේ නම් නුවණැත්තාද
හැබැවින්ම හඬමින්ද වැළපෙමින්ද සිහි මුළාවම
ඒ දෙසට යොමුවෙය

නහි රුණෙණන, සොකෙන සනතිං පපොති
චෙතසො,
භියයසසුපපජජතෙ දුකඛං සරීරං උපහඤඤති

හැඬීමෙන් හෝ සෝකයෙන් කිසිදු සුවයක්
සිතට නොම එන්නේය. බොහෝ දුක් ගොඩක්ම
නොනව වෙතට පැමිණෙන්නේය.
ගතද සොවින් දිරා යය

කිසො විවණෙණා භවති හිංසමතතානමතතනා,
න තෙන පෙතා පාලෙනති නිරතථා පරිදේවනා.

කෘශ වීමෙන් ද ශරීර දුර්වර්ණ වීමෙන්ද තමාම
නසන්නේය. හැඬීම නිසා මළ අය පවා නැවත
නොඑන්නේය. නොරක්නේය. මේ නිසා හැඬීම
නිරර්ථකය.

සොකමප්පජ්ජං ජනතු හීයෙයා දුකඛං නිගච්ඡති,
අනුත්ථුනන්තො කාලකතං සොකස්ස වසමන්වගූ.

ඥාති ව්‍යසනයේදී සෝකය අත්නොහැර සෝක
කරන්නා තව බොහෝ දුකට පත්වෙයි.
කළුරිය කළ අය ගැන සිතමින් හෙතෙම
සෝකය වෙතටම ගමන් කරයි.

අඤ්ඤෙපි පස්ස ගමිනෙ යථාකම්මූපගෙ නරෙ,
මච්චුනො වසමාගම්ම ඵන්දනෙත විධ පාණිනො.

මරණය අභියස බිය වී සැළෙන, රැස්කළ කර්ම ද
රැගෙන පරලොව ගොස් විඳීමට සූදානම්ව සිටින
ලොව අන්‍ය ප්‍රාණීන් දෙස බලන්න.

යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති
අඤ්ඤථා,
එතාදිසො විනාභාවො පස්ස ලොකස්ස පරියායං.

යමෙක් යමක් සිතාගෙන සිටියද එනමුත් සිදුවන්නේ
වෙනස් දෙයක්මය. විපරිණාමය හෙවත් වෙනස් වීම
ලොව ඇති සොබා දහමක් ලෙසම දැකීම අගනේය



අපි චෙ වස්ස සතං ජීවෙ භීයො වා පන මානවො,
ඤාතිසඞ්ඝා විනා හොති ජහාති ඉධ ජීවිතං.

යම් මනුෂ්‍යයෙක් අවුරුදු සියයක් හෝ එයට
වඩා ජීවත් වුවද සිය ඥාති සමූහයාගෙන් වෙන්ව
යන්නට සිදුවේමය. මේ ජීවිතයේ හැබෑ ස්වභාවය
එසේ දත යුතුය.

තස්මා අරහතො සුත්වා විනෙය්‍ය පරිදෙවිතං,
පෙතං කාලකතං දිස්වා න සො ලබ්භා මයා ඉති.

දකින විට අයෙක් මෙලොව හැරපියා යන ගමන,
නැවත කිසිදා ඔබ දකගන්නට නොලැබේය
යනුවෙන් සිතා වැළපීම දුරු කර ගැනීම පිණිස
සම්බුදු රහතුන්ගේ දහම පිහිට කොට ගත යුතුය.

යථා සරණමාදිත්තං වාරිනා පරිනිබ්බුතො,
එවම්පි ධීරො සප්පඤ්ඤො පණ්ඩිතො කුසලො නරො
ඛිප්පමුප්පතිතං සොකං වාතො තූලංව ධංසයෙ.

ගිනිගත් ගෙයක් දියෙන් යම්සේ නිවන්නේ ද
ඒ අයුරින්ම නුවණැති, ධෛර්‍ය සම්පන්න, කුසල්
මග ගමන් කරන ඥානවන්ත තෙමේ, පුළුන්
පොදක් පිඹ හරින මහ සුළඟ විලස උපන්
ශෝකය දුරුකර හරින්නේය.

පරිදෙවං පජප්පඤ්ච දොමනස්සඤ්ච අත්තනො,

අත්තනො සුඛමෙසානො අබ්බහෙ සල්ලමත්තනො

තමාගේ සැනසීම සොයන මනුෂ්‍යයෝ විසින්
වැළපීම, බැඳීම නම් වූ තෘෂ්ණාව සහ දොම්නස
නම් වූ තම ජීවිතයේ සැපත වනසන සෝක
හුල උදුරා දැමිය යුත්තේය

අබ්බුළ්හසල්ලො අසිතො සන්තිං පප්පුය්‍ය
චෙතසො,

සබ්බසොකං අතික්කන්තො අසොකො හොති

නිබ්බුතොති.

ශෝක හුල උදුරා දමා, තෘෂ්ණාවෙන් තොර වී
සිතේ සැනසුම ලබාගත් විට සියළු ශෝකයන්
බැහැර කොට පිරිනිවුනේ අශෝක නම් වේමය

---

**තථාගත බුදුරජාණන් වහන්සේ විසින් මිනිස් සන්තානයේ**

**ශෝකය දුරු කිරීම පිණිස දේශිත,**

**සුත්ත නිපාතයේ සල්ල සූත්‍රය ඇසුරින්**

**සකස් කරන ලද්දේ**

**ආචාර්ය පූජනීය**

**මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ විසිනි**

"මහණෙනි, නුඹලා දීර්ඝ කාලයක්
මව්වරුන් මියයාම නිසා දුක් වින්දාහ
එසේ මනාපයන්ගෙන් වෙන් වීම නම් වූ
මව වෙන් වීම නිසා හඬන වැළපෙන විට
වැගුරූ කඳුළු සිව් මහා සාගරයෙහි
ජලයටත් වඩා වැඩිය"

(අස්සු සූත්‍රය)